**දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල - 2016**

---

දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1992 අංක 09 දරන දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල් පනතේ 9(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

---------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

#### 2.2.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 751 ප්‍රකාරව මිලදී ගන්නා සියළුම භාණ්ඩ, තොග ලේඛනයක ඇතුළත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මිලදී ගන්නා ලද රු.1,184,050 ක් වටිනා අක්ෂි කාච 133 ක් තොග පොතට ඇතුළත් නොකර දෘශ්‍යාබාධිතයින් වෙත සෘජුවම නිකුත් කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

--------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම් කටයුතුවලින් රු. 513,678 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.1,256,732 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම රු.1,770,410 ක් විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු සඳහා වූ වියදම් රු.2,012,165 කින් වැඩිවීම බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 4.1 කාර්යසාධනය

---------------

1992 අංක 09 දරන දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල් පනතට අනුව සඳහන් පරමාර්ථ ඉටුකළ යුතුවේ.

(අ) දෘශ්‍යාබාධිතයන් සඳහා අධ්‍යාපනික සහ වෘත්තීය පුහුණු පහසුකම් සැපයීම, සේවා නියුක්ති අවස්ථා ඇතිකිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී ඔවුන්ට ස්වයං රැකියා සඳහා මූල්‍යාධාර සහ මාර්ග දේශකත්වය ලබාදීම.

(ආ) දෘශ්‍යාබාධිතයන්ට ශාස්ත්‍රීය පාඨමාලා හැදෑරීමට හෝ වෘත්තීය පුහුණුව ලබාගැනීමට හැකිවනු පිණිස ඔවුන්ට නිවාස පහසුකම් සැපයීම.

(ඇ) දෘශ්‍යාබාධිතයන්ගේ සුභ සාධනය පිණිස යෝජනා ක්‍රියාත්මක කිරීම.

(ඈ) දෘශ්‍යාබාධිතයන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා අලෙවි පහසුකම් සැපයීම

(ඉ) සමාන අයිතිවාසිකම් හා සමාන අවස්ථා ලබාගැනීමෙන් දෘශ්‍යාබාධිත තැනැත්තන් වළක්වාලන තත්ත්වයන් නැති කිරීමට ක්‍රියාකිරීම.

සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ මෙම පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා රු.8,059,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. කෙසේ නමුත් මෙම පරමාර්ථවලින් (අ), (ඇ) සහ (ඉ) යන පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා රු.7,549,000 ක්වූ ප්‍රතිපාදනයෙන් රු.6,839,940 ක් පමණක් වැය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සිසුන් 250 දෙනෙකු සඳහා අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු වෙනුවෙන් රු.3,800,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද ලුවීබ්‍රේල් ශිෂ්‍යාධාර, උසස් පෙළ සිසුන් ශිෂ්‍යාධාර සහ විශ්ව විද්‍යාල සිසුන් ශිෂ්‍යාධාර වශයෙන් සිසුන් 231 දෙනෙකුට ආධාර ලෙස රු. 1,307,100 ක් පමණක් ලබාදී තිබුණි.

සිසුන්ට ශිෂ්‍යාධාර ලබාදීමේදී ඉකුත් වර්ෂයට අදාල මාස 03 ක ගෙවීම් ප්‍රමාදවී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන වලින් ඒ සඳහා රු.177,000 ක් වැය කර තිබුණි. එම ප්‍රමාදය වළක්වාගැනීමට නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. ඉකුත් වර්ෂයේ සිසුන් 165 දෙනෙකුට ආධාර ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ සිසුන් 231 කට ආධාර ලබාදීමෙන් සැළකියයුතු වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

(ආ) පුනරුත්ථාපන වැඩසටහන යටතේ ආයතන 02 ක අන්ධ පුද්ගලයන් 36 දෙනෙකු වෙනුවෙන් රු.1,750,000 ක් ආධාර ලබාදීමට සැළසුම් කර තිබුණද ඉන් 16 දෙනෙකුට රු. 1,185,760 ක ආධාර ලබාදී තිබුණි. ඉකුත් වර්ෂ 06 ඇතුළතම උපදේශකවරුන් 07 දෙනෙකු විසින් සිසුන් 16 දෙනෙකුට පුහුණුවීම් ලබා දී තිබූ නමුත් එම සංඛ්‍යාවේ වැඩිවීමක් සමාලෝචිත වර්ෂයේදීද සිදුවී නොතිබුණි.

(ඇ) සීදූව ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන දෘශ්‍යාබාධිත කාන්තා මධ්‍යස්ථානය මගින් මැහුම් පුහුණු පන්ති පවත්වා තිබුණේ සිසුන් 03 දෙනෙකුට පමණක් වූ අතර පසුගිය වර්ෂ කිහිපය සැලකීමේදී පුහුණුලාභීන් සංඛ්‍යාවේ වර්ධනයක් දක්නට නොතිබූ බැවින් පුහුණුලාභීන් සංඛ්‍යාව වර්ධනය කර ගැනීමට කළමනාකරණය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රීඩා දක්ෂතා වර්ධනය කිරීම සඳහා රු.200,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද, එය උපයෝජනය කර නොතිබුණි.

(ඉ) අරමුදල විසින් ඉටුකළයුතු පරමාර්ථ අතරින් වූ දෘශ්‍යාබාධිතයන්ට ශාස්ත්‍රීය පාඨමාලා හැදෑරීමට හෝ වෘත්තීය පුහුණුව ලබාගැනීමට හැකිවනු පිණිස ඔවුන්ට නිවාස පහසුකම් සැපයීම් වෙනුවෙන් කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ පවත්වනලද කළමනාකරණ මණ්ඩල රැස්වීම්වලදී දෘශ්‍යාබාධිත අය සහ සියළුම ආබාධිත පුද්ගල සංඛ්‍යාව පිළිබඳව දත්ත ඒකකයක් පවත්වාගෙන යාම හා දෘශ්‍යාබාධිතයන් සඳහා සමාජ ආරක්ෂණ ක්‍රමයක් සකස් කිරීමට යෝජනා සම්මත කර ගෙන තිබුණු නමුත් එම කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අරමුදලේ කළමනාකරණය හා පරිපාලනය සම්බන්ධයෙන් වගකීම සාමාජිකයන් 13 දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් වෙත පැවරී තිබුණද සාමාජිකයන් දෙදෙනෙකු ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද කිසිදු කළමනාකරණ මණ්ඩල රැස්වීමකට සහභාගිවී නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | වැඩසටහන් පරිපාලනය | දෘශ්‍යාබාධිත පුද්ගලයින් වෙනුවෙන් පුනරුත්ථාපන වැඩසටහන් ප්‍රමාණාත්මක ලෙස සංවිධානය කර නොතිබීම. |
| (ආ) | මූල්‍ය පාලනය | අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු සඳහා ප්‍රමාණවත් ලෙස ආධාර ලබානොදීම. |